ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 4 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU4531 - ඉගෙනුම් ඉගැන්වීම් පර්යාලෝක**
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.02.26 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## I වන කොටස

01. අධ්‍යාපනය පිළිබඳ ඇරිස්ටෝටල්ගේ (Aristotle) අදහස කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනයේ හඳුනාගත හැකි ලක්ෂණ හතරක් (04) සඳහන් කරන්න.

03. පසුගිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රවේශ නිපුණතා (දරුවන් හඳුනා ගැනීම) හඳුන්වා දීමට හේතු කෙටියෙන් විස්තර කරන්න.

04. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා අඛණ්ඩව පැවතීම පිළිබඳ ඔබේ අදහස කුමක් ද?

05. ප්‍රාථමික අධ්‍යාපන මට්ටමින් නිපුණතා පදනම් කරගත් අධ්‍යාපනය කෙටියෙන් විස්තර කරන්න.

06. ප්‍රීතිමත් ඉගෙනුම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

07. මුල් ළමාවියේ සෙල්ලම යන්න සුදුසු උදාහරණයක් දෙමින් නිර්වචනය කරන්න.

08. ඩේල්ගේ අත්දැකීම් කේතුව ඇඳ පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) මාරියා මොන්ටිසෝරි විසින් යෝජනා කරන ලද මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ චින්තනය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) මාරියා මොන්ටිසෝරි පවසන පරිදි, පෙර පාසල් ගුරුවරයා පෙර පාසල් දරුවන්ට සුදුසු පාඩම් සකස් කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනය සම්බන්ධ වත්මන් ගැටළු ලැයිස්තු ගත කරන්න. (ලකුණු 10)

(ii) ඔබ ඉදිරිපත් කළ වත්මන් ගැටළු ජය ගැනීම සඳහා රජයට ගත හැකි උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

11. (i) මුල් ළමාවිය ඉගෙනීමේ දී දරුවන්ට ප්‍රීතිය ඇති කරන සාධක විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ඕනෑම ප්‍රාථමික ශ්‍රේණියක ඉගැන්වීම් සඳහා තේමාවක් තෝරා ගන්න. තේමාවට ගැලපෙන අන්තර් ක්‍රියාකාරකම් ප්‍රීතිමත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමේ දී ගුරුවරයාගේ කාරය භාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) ඉගෙනුම් ආධාරක යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(ii) ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ආධාරක භාවිතයේ ඇති වැදගත්කම උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ප්‍රාථමික අංශයෙන් තෝරාගත් පාඩමක් සඳහා සුදුසු ඉගෙනුම් ආධාරක ලැයිස්තුවක් සකස් කරන්න. ඒවායින් එකක් (01) තෝරාගෙන එය සාදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) ළමා හිතකාමී ඉගෙනුම් පරිසරයක් සකස් කිරීමේ දී ඔබ සලකා බැලිය යුතු භෞතික අවශ්‍යතා සහ මනෝ විද්‍යාත්මක අවශ්‍යතා ලැයිස්තු ගත කරන්න. (ලකුණු 10)

(ii) ළමා හිතකාමී ඉගෙනුම් පරිසරයක් සකස් කිරීමේ දී දරුවන්ගේ ශාරීරික අවශ්‍යතා සහ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා සහතික කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -